Major correction - Put to abstract Format

ID 467

# වත්මන් සමාජයේ ගැබිනි මාතාවන්ට නොලැබෙන රැකවරණයක් ගැමි අභිචාර විධි මඟින් එදා ගැබිනි මාතාවන්ට කොතෙක් දුරට ලබා දී ඇතිද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යනයක්

## (නුවරකලාවියේ 'බෝදිලිමා යාගය' ඇසුරින්

ඒ එම් එන් බී අත්තනායක[1],ජේ සී එස් ජයලත්[2],ආර් එම් ටී බී රත්නායක[3]

මානව ශාස්ත්‍ර අධ්‍යනාංශය,ඉතිහාසය[1,3] (විශේෂවේදී),සිංහල[2] (විශේෂවේදී)

chathujayalath7@gmail.com

ලාංකේය සමාජය දෙස බලන කල ප්‍රධාන වශයෙන්ම ගැමි සමාජයේ ශාන්තිකර්ම රාශියක් ඇති බව පැහැදිලි කරුණකි.එබඳු ශාන්තිකර්ම බුද්ධාගම ඇසුරින් ඇති වූවා නොව ජන සංස්කෘතිය තුළින්ම ප්‍රභවය ලත් ඒවාය.මෙම ජන ආගම් වල එන විවිධාකාර වූ පූජා කර්මයන් ගැමි සංස්කෘතිය සකස් කිරීමට පමණක් නොව,එය හැසිරවීමටත් බෙහෙවින්ම බලපා ඇත.අතීත ගැමියන් එම ශාන්තිකර්ම සිදු කිරීමෙන් බලාපොරොත්තු වූ දෙයට අමතරව අභ්‍යන්තරව එයට පාදක වූ සමාජීය යටි අරමුණක්ද බොහෝ විට මෙම ශාන්තිකර්ම,යාග,බලි,තොවිල් ආදියේ දක්නට ලැබේ.එලෙස ඉතා වටිනා සමාජ විද්‍යාත්මක අරමුණක් උදෙසා නුවර කලාවියේ ගැමියන් විසින් ගොඩනගාගත් සුවිශේෂී යාගයකි මෙම "බෝදිලිමා යාගය".මෙම යාගය සිදු කරනු ලබන්නේ බෝදිලිමා යක්ෂණිගේ බැල්ම වැටුණු පිරිමින්හටය.ගැමියන් තම ජීවිතයට යක්ෂ භූතාදීන්ගේ බලපෑම ඇතැයි යන විශ්වාසය මුල් කරගෙන යාග කර්මවලට යොමුව ඇත.යක්ෂයන්ගේ බලපෑම නිසා ඇති කරන ලෙඩරෝග වලට,ඊට නියමිත යක්ෂයාට පූජා කර්මයක් පවත්වා දොල පිදේනි දීමෙන් එම යක්ෂයාගේ නොයෙකුත් බැල්ම ආතුරයාගෙන් ඉවත් කළ හැකියැයි විශ්වාස කරන ගැමියා විසින් මෙම බෝදිලිමා යාගය සිදු කරනු ලබන්නේ බෝදිලිමා අවතාරය ආවේෂ වූ පිරිමියා සඳහාය.දරුවකු ලැබීමට සිටි කාන්තාවක් සැමියා කෙරෙහි වෛරයෙන් මිය ගිය විට ඇය යක්ෂණියක ලෙස උපදින බවත් ඇය බෝදිලිමා බවත් ගැමියන් විශ්වාස කරති.මෙම යාගයේ සියලුම කටයුතු සිදු කරනු ලබන්නේ කාන්තාවන් පමණක් වීමත් මෙහි ආතුරයා පිරිමියෙක් පමණක් වීමත් මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයකි.මෙහිදී මෙම ආතුරයා මෙම යාගයට පැමිණෙන කන්‍යාවියන් බලි මඩුව වෙත කැඳවාගෙන එනු ලබන්නේ පා දෝවනය කිරීමෙන් අනතුරුවය. මෙසේ ඇරඹෙන බෝදිලිමා යාගය හෙවත් කන්‍යා යාගය පුරාවටම එම ආතුරයා මෙම කන්‍යාවියන්ට වැදුම් පිදුම් ගරු සත්කාර කරනවා මෙන්ම ඔවුන්ට අවනත විය යුතුය.මෙම යාගය අවසානයට එම ස්ත්‍රීන් විසින්ම මෙම බෝදිලිමා දෝශය ඉවත් කර මොහුට සෙත සලසනු ලැබේ.මෙම යාගයේ මතුපිට අර්ථයට වඩා සමාජ විද්‍යාත්මක අර්ථයක් එහි ගැබ්ව ඇත.එනම් තම ගැබ්ගත් බිරිඳ හෝ වෙනත් ස්ත්‍රියක පීඩාවට ලක් කිරීම හෝ ඇය මරණයට පත් කිරීමට තරම් සාහසික වන පිරිමින් එම සාපරාදී අපරාදය කෙරෙහි බිය වැද්දවීමත්, මින් මතුවට එවැනි අපරාධ නොකිරීමටත්. කාන්තාව කෙරෙහි ගෞරවය ඇති කිරීමත් මෙම යාගයේ සමාජ විද්‍යාත්මක අරමුණ බව සිතිය හැක. ගැමියන් තම ගැබ්බර සිරියාවන් ආරක්ෂා කිරීමට මෙවැනි අභිචාර විධි පවා අනුගමනය කලත් වර්තමාන සමාජය තුළ ගැබිනි කාන්තාවන්ට සිදුවන විවිධ අතවර දිනපතාම පාහේ අසන්නට දකින්නට ලැබීම මෙම

ID 467

වකවානුවේ දක්නට ඇති ඛේදජනක ඉරණමකි.අතිතයේදී ගැමියා ගර්භ සංරක්ෂණය සහ දාරකෝප්පත්තිය සඳහා විවිධ අභිචාර විධි මෙන්ම ගර්භනී කාන්තාවන් පිරිමි පාර්ශවයෙන් ආරක්ෂා කර ගැනීම සඳහාද උපක්‍රමයක් වශයෙන් බෝදිලිමා සංකල්පය ඔස්සේ මෙම බෝදිලිමා යාගය සිදුකර ඇති බවට විශ්වාස කළ හැකිය.අතීතය හා වර්තමානය සසඳන විට වත්මන් සමාජයේ ගැබිනි මාතාවන්ට නොලැබෙන රැකවරණයක් ගැමි අභිචාර විධි මඟින් එදා ගැබිනි මාතාවන්ට කොතෙක් දුරට ලබා දී ඇතිද යන්න පිළිබඳව  අදහසක් බෝදිලිමා යාගය ඇසුරෙන් මෙම විමර්ශනාත්මක අධ්‍යනය තුළින් ලබා ගත හැකිවේ.

ප්‍රමුඛ පද

ගැමි,අභිචාර විධි,ගැබිනි කාන්තාවන්,රැකවරණය,බෝදිලිමා යාගය